ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

නීති ක්‍රම - **LWU 1412**

කාලය - පැය තුනයි.

212

දිනය -2007.03.13 වේලාව - පෙ.ව.10.00 -ප.ව.01.00 දක්වා

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.*

## පළමු කොටස - රෝම නීතිය

01. ස්වීය නෛතිකත්වය හිමි **(sui juris)** රෝම පුරවැසියකු වන ටයිටස් විසින් තමන්ගේ එකම පුතුවන කොර්නේලියස් සඳහා භාරකරුවකු ලෙස බෲටස්ව පත්කරන ලද්දේ අන්තිම කැමති පත්‍රයක් මගිනි. කොර්නේලියස් හට වයස අවුරුදු හයක් වන විට ටයිටස් මිය ගිය අතර බෲටස් විසින් අදාල දේපලෙහි පාලනය තමන්ගේ අතට ගන්නා ලදී. ඉන්පසු බෲටස් විසින් කොර්නේලියස් සතු වටිනා දේපල කිහිපයක් ඒවායේ සත්‍ය වටිනාකම මෙන් හතරෙන් එකක (1/4) පමණ මිලකට ලබා ගන්නා ලදී. කොර්නේලියස්ගේ වයස අවුරුදු 18 වන විට ඔහු සතු තවත් වටිනා දේපළ කොටසක් මීට පෙරදී මෙන් අඩු මිලකට තමාට විකුණන ලෙසට බෲටස් විසින් ඉල්ලා සිටි අතර කොර්නේලියස් විසින් එකී ඉල්ලීම ද ඉටු කරන ලදි.

කොර්නේලියස් වයස අවුරුදු දහනමයේ දී ක්ලියෝපැට්‍රා සමඟ ජීවත්විමට පටන් ගත් නමුත් මාස 09 කට පසුව ඇය විසින් ඔහුව අත්හරින ලදී. වසර කිහිපයකට පසු කොර්නේලියස් හට අවුරලියා (රෝම පුරවැසියකු) හමු වූ අතර එතැන් පටන් වසර 15 ක් එකට ජීවත් වූ මොවුන්හට පුතුන් දෙදෙනෙකු සහ එක් දියණියක් සිටින ලදී.

**(i)** සත්‍ය වටිනාකමට වඩා අඩුවෙන් විකුණන ලද දේපල වෙනුවෙන් කොර්නේලියස්හට කුමන හෝ සහනයක් අයැද සිටිය හැකි ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(ii)** පහත පාර්ශ්වයන්ගේ නෛතික සම්බන්ධතාවයේ ස්වභාවය කුමක් ද? (ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.)

- **(a)** කොර්නේලියස් සහ ක්ලියෝපැට්‍රා
- **(b)** කොර්නේලියස් සහ අවුරලියා

(ලකුණු 05)

**(iii)** කොර්නේලියස් සහ අවුරලියා හට තම දරුවන් කෙරෙහි පවතින බලතල මොනවාද ?

(ලකුණු 07)

02. ප්‍රසිද්ධ සිත්තරකු වූ ෆ්ලේවියස් තමාගේ ඉතා වටිනා හා ගෞරවාදරයට ලක්වූ සිතුවම් කිහිපයක් තබා ප්‍රදර්ශණයක් පැවැත්වීමට තීරණය කරයි. ඔහු රෝමයේ විශාල ශාලාවක් ඒ සඳහා කුලියට ගත් අතර ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා සෙනට් සභිකයන් **(Senators)** සහ පොහොසත් පැට්‍රීෂියන්වරු **(Patrician)** ඇතුළු බොහෝ වැදගත් පුද්ගලයන්ට ආරාධනා කරයි.

සමාරම්භක උත්සවය අතරතුරේදී ක්ලෝඩියස් සහ කැෂියස් ආරාධනාවක් රහිතවම තමන්ගේ වහලුන් සමග ශාලාවට පැමිණෙන ලදී. මොවුන් එම සිත්තම් ෆෙලේවියස් විසින් නිර්මාණය කරන ලද ඒවා නොවන බවත් ඔහු සත්‍ය කලාකරුවෙකු බවට මවාපාන බවත් කියමින් ශබ්දනගා කෑගැසීමට පටන් ගන්නා ලදී.

ක්ලෝඩියස් විසින් "මෙතරම් අලංකාර දර්ශන මෙවැනි නපුරු හා රළු හදවතක් ඇති මිනිසකුට කෙසේ සිත්තම් කල හැකි ද? රෝමයේ ඉතාම අවලස්සනම කාන්තාව වන ඔහුගේ බිරිඳ දෙස බැලීමෙන් ඔහුගේ ලස්සන නැමැති අදහස වඩාත් පහසුවෙන් ඔබ තේරුම් ගත හැක. ඇය ඌරන්ට කෑමදීමට යාමේදී ඇගේ මුහුණ ආවරණය කර ගැනීමට සිදුවන්නේ එසේ නැතහොත් උන් කෑම ප්‍රතික්ෂේප කරන බැවිනි." ප්‍රකාශ කරන්නට විය.

ඉන්පසු කැෂියස් විසින් ඔහුගේ කඩුව ගෙන සිතුවම් විනාශ කිරීමට හා කැපීමට පටන් ගන්නා ලදී. ෆ්ලේවියස් ගේ විශ්වාසවන්ත සේවකයකු මෙන්ම හෙරඩොටස් ගේ දේපලවල එකම උරුමකරු ලෙස මෑතකදී පත්කරන ලද සර්වියස් එම සිතුවමක් ඉදිරියේ සිට ගනිමින් එය විනාශ කිරීම වැලැක්වීමට උත්සාහ ගන්නා ලදී. කැෂියස් කඩුවෙන් සර්වියස්ට පහර දුන් අතර මාරාන්තික තුවාල සිදුවූ සර්වියස් පසුව මිය ගියේය. ෆ්ලේවියස්ගේ තවත් වහලකු වූ ඩාරියස්ට ද තුවාල වූ අතර ඔහුගේ එක් ඇසක පෙනීම අහිමි වන ලදී.

ඉහත සිද්ධීන්ට අදාළව ෆ්ලේවියස්හට ලබාගත හැකි නෛතික ප්‍රතිකර්ම සාකච්ඡා කරන්න.

03. පහත සඳහන් ප්‍රකාශයන් අතරින් <u>දෙකක</u> නිවැරදිභාවය සාකච්ඡා කරන්න.

**(i)** හුදෙක් නොමිලයේ සහ තමන්ට ලැබුණු දෙයක් හෝ ඊට සමාන දෙයක් එලෙසම ආරක්ෂා කර තබා ගැනීමට ඒවා ලද පුද්ගලයා සතු බැඳීම දක්වන්නා වූ ගිවිසුම් රෝම නීතිය මඟින් හඳුනා ගනී.

**(ii)** යම්කිසි පුද්ගලයකු නොමැති අවස්ථාවක එවැන්නකුගේ කටයුතු පාලනය කරනු ලබන පුද්ගලයෙකුට එසේ කිරීම සඳහා යන වියදම් පියවා ගැනීමේ ප්‍රතිකර්මයක් නොමැත.

**(iii)** ජස්ටිනියස් තමන් රෝම අධිරාජ්‍යා ලෙස කටයුතු කරන වකවානුවේදී රෝම නීතියේ සියලු අංග සංග්‍රහගත කරන ලදී.

**(iv)** රෝම නීතිය මඟින් අන්තිම කැමති පත්‍රකරුවෙකුට තමන්ගේ දේපල විනාශ කිරීමේ පූර්ණ නිදහස ලබා දී ඇත.

04. කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(i) "පරවශ්‍යතාවයන්ගේ වර්ගීකරණය, ඒ සමඟ බැඳී ඇති අයිතිවාසිකම් හඳුනා ගැනීම උදෙසා ප්‍රබල භූමිකාවක් නිරූපණය කරයි."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(ii) "යම් දෙයක් (res) සඳහා අයිතිය **jus gentium** යටතේ විවිධාකාරයෙන් අත්කරගත හැක. මෙම ක්‍රම අතරින් සමහරක් මගින් නියම අයිතිකරු අයිතිය හුවමාරු කිරීමට බලාපොරොත්තු වූවේද නැද්ද යන්න නොසලකා අයිතිය මාරුකිරීමට හැකියාව ලබාදේ. එසේම අත්පත්කර ගන්නා අවස්ථාවේදී අයිතිකරුවෙකු නොමැති භාණ්ඩ සම්බන්ධයෙන් ද අයිතිය ලබාගත හැකිය."

අත්පත්කර ගැනීමේ විවිධ ක්‍රම හා ඒවායේ යෙදුම පිළිබඳ උදාහරණ ආශ්‍රයෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය පිළිබඳ අදහස් දක්වන්න.
(ලකුණු 14)

<u>දෙවන කොටස - නීති ක්‍රම</u>

05. "නීතිය වූ කලී විවිධ මූලාශ්‍රයන්ගෙන් සමන්විත වන්නක් බැවින් යම් දෙන ලද අවස්ථාවක දී රටක නීතිය යනු කුමක්දැයි හඳුනා ගැනීම සරල කර්තව්‍යයක් නොවේ. සමාජ වෙනස්කම්වලට අනුකූලව නීතියෙහි ස්වභාවය සමහර මූලාශ්‍රයන් මගින් හැඩගස්වනු ලබන අතර, තවත් මූලාශ්‍රයන් මගින් විශේෂිත අයිතීන් ආරක්ෂා කරනු ලබන අතර අනෙක්වා දැඩි නීතියේ අනම්‍යශීලීභාවය සමනය කරයි. ඒ අනුව ඒ එක් එක් මූලාශ්‍රය විශේෂිත වූ ක්‍රියාකාරකමක් සපුරන අතර ඒ අනුව මූලාශ්‍රවල එකතුවක් මගින් නීතිය යන අදහසෙහි අපේක්ෂාවන් තෘප්ත කරනු ලබයි."

ශ්‍රී ලංකාවට අදාල කරගත හැකි නීති මූලාශ්‍ර ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

*මූලාශ්‍රයන්ගේ අන්තර්ගතය පිළිබඳ වූ සවිස්තරාත්මක සාකච්ඡාවක් බලාපොරොත්තු නොවේ.*

06. මුවගම වූකලී විශාල වනාන්තරයක් අද්දර පිහිටි කුඩා ගම්මානයකි. මෙම වනාන්තරය වූකලී විවිධ වන සතුන්ගේ වාස භූමියක් වන අතර විශේෂයෙන් විවිධාකාර මුව වර්ගයන් මෙහි සිටී. පසුගිය කාලය තුලදී මෙම වනාන්තරයට නව වටිනාකමක් ලැබී ඇත්තේ, පාසැල්වල සහ විශ්වවිද්‍යාලවල විද්‍යා සිසුන් ද ඇතුළුව දේශීය හා විදේශීය සංචාරකයින් මුවන් සිටින ස්වභාවික වාසස්ථාන පිළිබඳව අධ්‍යයනය කරනු ලබන හෙයිනි.

සමහර ගම්වාසීන් විසින් දිගුකාලීන පුරුද්දක් ලෙස මුවන් දඩයම් කිරීම සිදු කරයි. මුව මස් ප්‍රනීත ආහාරයක් වන අතර ගම්මානයේ සමහර මුදලාලිවරුන් කිහිපදෙනෙක් මුව මස් සැපයීම සිදු කරයි. මෑතදී සිදුකරන ලද අධ්‍යයනයකින් හෙළි වූ පරිදි මුව ගහණය දැඩි ලෙස පහත වැටී ඇති අතර දඩයම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමහර මුවන් වර්ග වඳවීමටද හේතු වී ඇත.

"මුවන් ආරක්ෂා කරන්න" නැමැති සත්ව ආරක්ෂණ කණ්ඩායම මෙම ප්‍රශ්නය සඳහා රජයේ නිලධාරීන්ගේ මැදිහත්වීමක් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ඊට පෙර මුව දඩයම වූ කලී මෙම ගම්මානයේ පවතින වලංගු චාරිත්‍රයක් ද යන්න තීරණය කිරීමට අදහස් කරයි. වයස අවුරුදු 50 ක් වූ රන්බණ්ඩා නැමැති මුව දඩයක්කරු පවසන්නේ ඔහුට පෙර ඔහුගේ පියාද මෙම රැකියාවේ නිරත වූ බවයි. වයස අවුරුදු 69 ක් වන උක්කු බණ්ඩා ප්‍රකාශ කරන පරිදි, මීට වසර 10 කට පමණ පෙර මුවන් දඩයම රජයේ

නිලධාරීන් මගින් තහනම් කරන ලද අතර දඩයම් කිරීම වලක්වාලීම සඳහා වනආරක්ෂකයින් පවා යොදවා තිබිණි. වයස අවුරුදු 91 ක් වන රන් එතනා දැක්වූ කරුණු අනුව යම් වකවානුවක දී මුවන්, ගම්මානය අවට සැරිසැරුමුත් කිසිවෙකුත් මුවන්ට හානියක් සිදු නොකරන ලදී. ඇය කියන පරිදි අදට පවා ගම්වැසියන් මුවමස් ආහාරයට ගැනීම කලාතුරකින් කරන අතර මුවන් මැරීම සිදු කරන්නේ කිහිප දෙනෙකු එකතුවී අසල පිහිටි නගර කිහිපයකට විකිණීම පිණිසයි.

"මුවන් ආරක්ෂා කරන්න" නැමැති කණ්ඩායම මෙම චාරිත්‍රය පිළිබඳව ඔබගේ උපදෙස් බලාපොරොත්තු වේ. ඔවුන්ට උපදෙස් දෙන්න.

07. **P v P** යනු වර්ෂ 1995 දී ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් තීරණය කරන ලද නඩුවකි. මෙම සිද්ධියේදී ක්‍රිස්තියානි භක්තිකයෙකුවූත් ඒ වන විට විවාහයක් කරගෙන සිටියාවූත් පුරුෂයෙකු, බෞද්ධ කාන්තාවක් සමඟ දෙවනවරටත් විවාහයක් ගිවිස ගන්නා ලදී. පළමු විවාහයේ බිරිඳ ද ජීවතුන් අතර සිටි අතර මේ වනතෙක් දික්කසාදයක් ලබාගෙන නොමැත. අධිකරණය තීරණය කරන ලද්දේ මෙම පුද්ගලයා ද්වි විවාහය නැමැති වරද එනම්, එක් වරකට එක් නීත්‍යානුකූල වෛවාහක පාර්ශ්වයකට වඩා තබා ගැනීම (ස්වාමි පුරුෂයා හෝ භාර්යාව) සිදු කර ඇති බවයි. තවද අධිකරණය මඟින් දක්වා සිටියේ මෙම පුද්ගලයා මුස්ලිම් තැනැත්තකු වූයේ නම් තත්වය වෙනස්වීමට තිබූ බවත් මුස්ලිම් අයෙකුට නීතියෙන් වලංගු භාර්යාවන් 4 ක් දක්වා සිටිය හැකි නිසා ප්‍රශ්නය වෙනත් ආකාරයකට තීරණය කිරීමට සිදුවිය හැකිව තිබූ බවත් ය.

**P v P** තීන්දුව පහත සඳහන් අවස්ථාවලදී අනුගමන පූර්ව නිදර්ශණයක් ලෙස භාවිතා කල හැකි ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(i) **2000** වසරේදී අභියාචනාධිකරණයට ඉදිරිපත් වූ නඩුවකදී පළමු විවාහයේ කාන්තාව සිටියදීම, මුස්ලිම් පිරිමියකු දෙවන වරටද විවාහයක් කරගෙන ඇති අතර මෙම විවාහයන් දෙකෙහිම කාන්තාවන් ද මුස්ලිම් අයවේ.

(ii) වර්ෂ 2005 දී ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් දුන් තීන්දුවකට අනුව ක්‍රිස්තියානි පුරුෂයෙකු තමන්ගේ පළමු විවාහයේ බිරිඳ සිටියදී හා එම විවාහය පවතින විටදී දෙවන විවාහයක් ද සිදු කරගෙන ඇත.

(iii) වර්ෂ 1969 දී ප්‍රිවි කවුන්සිලය මඟින් දුන් තීරණයකට අනුව බෞද්ධ කාන්තාවක් සමඟ විවාහ වී සිටි ක්‍රිස්තියානි පුරුෂයෙකු තම මුල් විවාහයේ බිරිඳ මියගිය විටදී තවත් ක්‍රිස්තියානි කාන්තාවක් සමඟ දෙවැනි විවාහයක් සිදු කර ගනී.

(iv) වර්ෂ 1989 දී තීරණය වූ අභියාචනාධිකරණ තීන්දුවකට අනුව ක්‍රිස්තියානි කාන්තාවක් තමන්ගේ පළමු විවාහයේ සැමියා ජීවතුන් අතර සිටියදී හා දික්කසාද නොවී සිටි අවස්ථාවක බෞද්ධ පුරුෂයෙකු හා දෙවන වරටද විවාහ විය.

08. ව්‍යවස්ථාපිත අර්ථනිරූපනයන්ට භාවිතා කරනු ලබන විවිධාකාර වූ පූර්ව නිගමන සියල්ල මඟින් තහවුරු කරනු ලබන්නේ, මූලික වශයෙන් ආවරණය කරලීමට අදහස් නොකලාවූ තත්වයන්ට හා පුද්ගලයින්ට ව්‍යවස්ථාවන්ගේ අදාළත්වයක් නොමැතිය යන පොදු අරමුණු ස්ථාපිත කිරීමයි.

ඔබගේ පිළිතුරට අදාල නඩු තීන්දු නීතිය හුවා දක්වමින් ඉහත ප්‍රකාශයෙහි වලංගුභාවය සාකච්ඡා කරන්න.

- හිමිකම් ඇවිරිණි. -